Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය:- ශිල්ප කලා

සතිය- 14

ශ්‍රේණිය :- 11

Prepared by-කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

## පුනරීක්ෂණ අභ්‍යාස

1.

පරාක්‍රමබාහු මහා විද්‍යාලයේ වර්ෂ අවසාන ප්‍රදර්ශනය සඳහා විදුහලේ ශිල්ප කලා හදාරන සිසුන් භාණ්ඩ රාශියක් සකස් කර තිබුණි. ප්‍රදර්ශන කුටි වලට විවිධ ක්ෂේත්‍රයන් සඳහා ජයග්‍රහණ රාශියක් ලබා දීමට අවස්ථා සැලසුම් කර තිබුණි.

i. පිවිසුම් දොරටුව අසල ඉදි කළ තොරණ සඳහා භාවිතා කර තිබුණු පරිසර හිතකාමී ද්‍රව්‍ය 02 ක් ලියන්න.

ii. මෙම ප්‍රදර්ශනයේ ආරාධිත අමුත්තන් සඳහා විශේෂ ආරාධනා පත් පිළියෙල කර තිබුණි. ඒ සඳහා භාවිතා කර තිබූ දේශීය අමු ද්‍රව්‍ය 02 ක් ලියන්න.

iii. ප්‍රදර්ශනයේ පිවිසුම් දොරටුවට නුදුරින් දිය ඇල්ලක් සහිත පොකුණක් ඉදිකර තිබුණේ ශිල්පකලා හදාරන සිසුන් විසිනි. එයට භාවිතා කර තිබූ අමු ද්‍රව්‍ය 04 ක් නම් කරන්න.

iv. ආරාධිත අමුත්තන් කැඳවාගෙන යෑමට අලංකාර නැටුම් කණ්ඩායමක් පුහුණු කර තිබුණි. එම කළ ගෙඩි නැටුමේ කළගෙඩි අලංකාර කිරීමේ ක්‍රම දෙකක් ලියන්න.

v. නැටුම් කණ්ඩායමේ ඇඳුම් අලංකාර කර තිබුණේ ද ශිල්ප කලා අංශයේ සිසුන් විසින් ම ය. රෙදි පිළි අලංකරණ ක්‍රම 04 නම් කරන්න.

vi. පොල්තෙල් පහන දැල්වීම උත්සව ආරම්භයේ දී කරනු ලබන සිංහල චාරිත්‍රයකි. පොල්තෙල් පහන පා මුල ධාන්‍ය බීජ මගින් අලංකාර කර තිබුණි. ඒ සඳහා යොදාගත හැකි හැඩතල 02 ක් නම් කරන්න.

vii. නිවේදන පුවරුව විචිත්‍රවත් කිරීම සඳහා යොදාගත හැකි සැරසිලි මාධ්‍යයන් 02 ක් නම් කරන්න.

viii. මෙම ප්‍රදර්ශනයේ විවිධ අලංකාරයට මැටි බඳුන් සකස් කර තිබුණි. මැටි භාණ්ඩ නිෂ්පාදනය කළ හැක ක්‍රම 02 ක් නම් කරන්න.

ix. ප්‍රදර්ශන කුටියේ මුළු භාවිතයෙන් කල නිර්මාණ ද තිබුණි. වුල් වලින් කළ හැකි නිර්මාණ 04 නම් කරන්න.

x. පාසල් භූමිය අලංකාර කිරීමට සිසුන් විසින් විවිධ තැන්වල මූර්ති සකස් කර තිබුණි. මූර්ති සෑදීමට භාවිතා කළ හැකි මාධ්‍ය 02 ක් ලියන්න. (ලකුණු 2x10=20)